2026-11-02 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

01. **යුරෝපා සංගමය සහ ශ්‍රී ලංකාව අතර තිරසර වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

යුරෝපා සංගමය සහ ශ්‍රී ලංකාව අතර තිරසර වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා යුරෝපා සංගමය විසින් එකඟතාව පළ කරනු ලැබ ඇත. හරිත සංක්‍රාන්ති මුල පිරීම් සහ දේශගුණික බලපෑම්වලට ඔරොත්තු දෙන වෙළෙඳ භාවිතයන් ප්‍රවර්ධනය කිරීම මඟින් ශ්‍රී ලංකාව සහ යුරෝපා සංගමය අතර තිරසර වෙළෙඳ සබඳතා ශක්තිමත් කිරීම, වෙළෙඳ කටයුතු හා සම්බන්ධ ආයතනික ධාරිතාවන් වැඩිදියුණු කිරීම සහ යුරෝපා සංගමයේ වෙළෙඳපොළ වෙත ප්‍රවේශයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීම පිණිස ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නයන්ට සහාය වීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීම එම ව්‍යාපෘතිය ක්‍රියාක්මක කිරීම මඟින් අපේක්ෂා කෙරේ. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය විසින් වසර 04ක කාලසීමාවක් තුළ යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලැබ ඇත. ඒ අනුව, එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් යුරෝ මිලියන 10ක ප්‍රදානයක් ලබා ගැනීම සඳහා වන මූල්‍ය ප්‍රදාන ගිවිසුම යුරෝපා සංගමය සහ ශ්‍රී ලංකා රජය අතර අත්සන් තැබීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

02. **අසර්බයිජානය සහ ශ්‍රී ලංකාව අතර රාජ්‍ය සේවා සැපයීමේ නවීන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමේ සහයෝගිතාව පිළිබඳව වන අවබෝධතා ගිවිසුම**

2026 නොවැම්බර් මාසයේ 05 සහ 06 යන දිනවල අසර්බයිජානයේදී පැවැත්වීමට නියමිත එක්සත් ජාතීන්ගේ පාලන ක්‍රම නව්‍යකරණ සම්මුඛවට සමගාමීව අසර්බයිජානයේ රාජ්‍ය සේවා හා සමාජ නවෝත්පාදන සඳහා වූ රාජ්‍ය ආයතනය සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය අතර රාජ්‍ය සේවා සැපයීම නව්‍යකරණය කිරීමේ ක්ෂේත්‍රය තුළ සහයෝගිතාවක් ඇති කර ගැනීම පිළිබඳව වන අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීමට යෝජනා වී ඇත. අදාළ ක්ෂේත්‍රයන්හි සුහුණු වැඩසටහන්, සීමාවාසික සුහුණු පැවැත්වීම හා ඒ සඳහා පහසුකම් සැපයීම, ගුණාත්මක හා ඵලදායී සේවා සැපයීම කහවුරු කිරීම පිණිස අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ සේවා තක්සේරු සිදු කිරීම ආදී අරමුණු සාක්ෂාත් කර ගැනීම එම අවබෝධතා ගිවිසුම මඟින් අපේක්ෂා කෙරේ. ඒ අනුව, වසර 03ක

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු තෝ T - (+94 11) 2515759
ෆැ පෙ F - (+94 11) 2514753
ඊ මි E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

කාලයකට වලංගු වන පරිදි යෝජිත අවබෝධතා ගිවිසුම දෙපාර්ශ්වය අතර අත්සන් තැබීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **යාපනය විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යාපීඨය සඳහා නවීන පහසුකම්වලින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදි කිරීම**

යාපනය විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යාපීඨය සඳහා නවීන පහසුකම්වලින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස 2025-09-15 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම පිණිස ජාතික තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 08ක් ලැබී තිබේ. එම ලංසු ඇගයීමෙන් අනතුරුව ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම්ව, සාරානුකූල ප්‍රතිවාරාත්මක අවම ලංසුකරු වන M/s Central Engineering Services (Pvt) Ltd වෙත රුපියල් මිලියන 2,025.73ක මුදලකට (එකතු කළ අගය මත බදු රහිත) එකී කොන්ත්‍රාත්තුව පිරිනැමීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **හැමිල්ටන් ඇළ ඇතුළු ජලාශ්‍රිත පරිසරය, සංචාරක ආකර්ෂණීය ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම**

සොබාදහම කේන්ද්‍ර කරගත් සහ ඓතිහාසික උරුම හුවා දක්වන සංචාරක ගමනාන්ත සංවර්ධන වැඩසටහනක් වශයෙන් බස්නාහිර පළාතේ වෙරළ හා මුහුදු ආශ්‍රිත හැමිල්ටන් ඇළ, මීගමු කලපුව ඇතුළු ජලාශ්‍රිත පරිසරය සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒ යටතේ, බස්නාහිර පළාත් සභාව විසින් කින්(ග්)ස් අයිලන්ඩ් ජැටියේ (මීගමුව කලපුව) සිට මා ඔය මෝය කට දක්වා හැමිල්ටන් ඇළ සංවර්ධනය කර සංචාරක කර්මාන්තයට යොදා ගැනීම අරමුණු කරගෙන ව්‍යාපෘති වාර්තාවක් සකස් කරනු ලැබ තිබේ. ඒ අනුව, හැමිල්ටන් ඇළ ඇතුළු ජලාශ්‍රිත පරිසරය සංචාරක ආකර්ෂණීය ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, රුපියල් මිලියන 700ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ අරමුදල් උපයෝජනය කරමින් ක්‍රියාත්මක කිරීම පිණිස විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා; සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **මහනුවර-යාපනය මාර්ගයේ (A9) වවුනියාව නගරය ආශ්‍රිත මාර්ග කොටස පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම**

ජාතික මහාමාර්ග පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ මහනුවර-යාපනය මාර්ගයේ (A9) වවුනියාව නගරය හරහා දිවෙන කිලෝමීටර 176+000 සිට කිලෝමීටර 179+000 දක්වා වන කිලෝමීටර 3ක දිගින් යුත් මාර්ග කොටස පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම පිණිස ජාතික තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා තිබේ. ඒ සඳහා ලංසු 07ක් ලැබී ඇත. එම ලංසු ඇගයීමෙන් අනාතුරුව ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම්ව, සාරානුකූල ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන M/s Kanwel Constructions & Civil Engineering (Pvt) Ltd වෙත රුපියල් මිලියන 1,318.3ක මුදලකට (එකතු කළ අගය මත බදු රහිත) එකී කොන්ත්‍රාත්තුව පිරිනැමීම පිණිස වැඩබලන ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **දිවිවා සුළි කුණාටුව හේතුවෙන් හානියට පත් මාර්ග යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම**

දිවිවා සුළි කුණාටුව හේතුවෙන් හානියට පත්ව ඇති මාර්ග කොටස් කිහිපයක් ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම පිණිස ජාතික තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා තිබේ. ඒ සඳහා ලැබී ඇති ලංසු ඇගයීමෙන් අනාතුරුව ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටු විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ මත පදනම්ව, පහත සඳහන් පරිදි සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරුවන්ට එකී කොන්ත්‍රාත්තු පිරිනැමීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

අනු අංකය	කොන්ත්‍රාත්තුව	ලැබී ඇති ලංසු සංඛ්‍යාව	නිර්දේශිත ලංසුකරු	කොන්ත්‍රාත්තුවෙ වටිනාකම (එකතු කළ අගය මත බදු රහිත)
01.	ගම්පොළ-නාවලපිටිය මාර්ගයේ (AB013) කිලෝමීටර 8+500 සිට 16+300 දක්වා, උලපනේ-පුස්සැල්ලාව මාර්ගයේ (B431) කිලෝමීටර 0+000 සිට කිලෝමීටර 6+440 දක්වා සහ අටබෑගේ-උලපනේ මාර්ගයේ (B490) කිලෝමීටර 0+000 සිට කිලෝමීටර 7+500 දක්වා වන මාර්ග කොටස් ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම.	04	M/s ELS Construction (Pvt) Ltd	රුපියල් මිලියන 852.83
02.	වත්තේගම - කන්දේනුවර -වාරියපොළ මාර්ගයේ (B461) කිලෝමීටර 11+000 සිට කිලෝමීටර 27+700 දක්වා වන කිලෝමීටර 16.77ක දිගකින් යුත් මාර්ග කොටස ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩිදියුණු කිරීම සහ එම මාර්ගයේ කිලෝමීටර 27+700 සිට කිලෝමීටර 30+800 දක්වා වන මාර්ග කොටසේ ජලාපවහන කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම හා රැඳවුම් බැම් (Retaining Walls) ආශ්‍රිත ඉදිකිරීම.	02	M/s Jayasinghe Contractors (Pvt) Ltd	රුපියල් මිලියන 1,516.08
03.	කටුගස්තොට - මඩවල - ඛඹරැල්ල මාර්ගයේ (B205) 19 වන කිලෝමීටරයේ සිට 34 වන කිලෝමීටරය දක්වා වන කිලෝමීටර 15ක මාර්ග කොටසෙහි සහ වත්තේගම - කන්දේනුවර - වාරියපොළ මාර්ගයේ (B461) 1 වන කිලෝමීටරයේ සිට 5 වන කිලෝමීටරය දක්වා වන කිලෝමීටර 4ක මාර්ග කොටසෙහි හානි වූ ස්ථානවල හා බෑවුම් කඩා වැටීම් සිදු වූ ස්ථානවල අලුත්වැඩියා කටයුතු සිදු කිරීම.	03	M/s RR Construction (Pvt) Ltd	රුපියල් මිලියන 965.37

07. **රත්ගම නගර සංවර්ධන ව්‍යාපෘතියට අදාළව ඉඩම් සංවර්ධනය සහ ජලාපවහන පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

දකුණු පළාතේ සංචාරක ආකර්ෂණයෙන් යුත් ගාල්ල සහ හික්කඩුව යන නගර අතර පිහිටි සේවා නගරය ලෙස සැලකෙන රත්ගම නගරය අවට, නිසි පරිදි නිර්මාණය කළ ජලාපවහන පද්ධතියක් නොමැකිවීම හේතුවෙන් මාර්ග හා ආශ්‍රිත ප්‍රදේශ වසරකට කිහිප වතාවක් ගංවතුර තර්ජනයට/ආපදාවට ලක් වේ. එම ගැටලුවට විසඳුමක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය විසින් රත්ගම නව නගරය සංවර්ධනය සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලැබ ඇත. එම නගර සංවර්ධන ව්‍යාපෘතියේ සැලසුම්වලට අනුව අදාළ ඉඩම් සංවර්ධනය හා ජලාපවහන පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින්, රුපියල් මිලියන 3,380.22ක (එකතු කළ අගය මත බදු සහිත) ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ, 2027-2029 කාලසීමාව තුළදී පහත සංරචකවලින් යුතුව ක්‍රියාත්මක කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* රත්ගම-දොඩන්ගොඩ මාර්ගය හා විජේරත්න මාර්ගය අතර පිහිටි, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් අත්කර ගෙන ඇති අක්කර 24.5ක් පමණ වන (වගා කටයුතු සිදු නොකර අත්හැර දමා තිබෙන) වෙල්යායෙහි අක්කර 13ක පමණ භූමි ප්‍රදේශයක් තුළ ජල තටාකයක් හා ජල රැඳවුම් ප්‍රදේශ නිර්මාණය කිරීම සහ ඉතිරි ඉඩම් කොටස් සංවර්ධනය කිරීම.

* එම අක්කර 24.5ක පමණ වෙල්යායට පහළ කොටසේ අක්කර 1.5ක පමණ බිම් ප්‍රමාණයක් අත්කර ගනිමින් අතිරික්ත වැසි ජලය නිසි ලෙස රත්ගම කලපුව වෙත යොමු කිරීම සඳහා ඇළ ඉවුරු සංවර්ධනය කිරීම, නඩත්තු ප්‍රවේශ මාර්ගය ඉදි කිරීම, ජලාපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ඉතිරි ඉඩම් කොටස් සංවර්ධනය කිරීම.

08. **වකුගඩු රෝගීන්ගේ රුධිර කාන්දුකරණය සඳහා භාවිත කරනු ලබන ඖෂධ සහිත බෑග් 1,100,000ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

තීව්‍ර හෝ දිගුකාලීන වකුගඩු අක්‍රියතාවයෙන් පෙළෙන, රුධිර කාන්දුකරණයට භාජනය වන රෝගීන්ගේ ශරීරයෙන් අපද්‍රව්‍ය සහ අතිරේක දියර ඉවත් කිරීම සඳහා භාවිත කරනු ලබන ඖෂධ සහිත බෑග් 1,100,000ක් සපයා ගැනීම පිණිස ජාත්‍යන්තර කරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා තිබේ. ඒ සඳහා

ලංසු දෙකක් (02) ලැබී ඇත. එම ලංසු ඇගයීමෙන් අනතුරුව ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම්ව, සාරානුකූල ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන ශ්‍රී ලංකාවේ Infuxion Lanka (Private) Limited, (Manufacturer: Peritone Health SDN BHD, Malaysia) වෙත, රුපියල් මිලියන 990ක මුදලකට එකී ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **ලයිපොසොමාල් වර්ගයේ ඇම්පොටෙරිසින් බී වයල් මිලිග්‍රෑම් 50න් වයල් 54,000ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

ක්‍රිප්ටොකොකල් මෙනින්ජයිටිස් (Cryptococcal meningitis) සහ අන්තරංග ලිෂ්මේනියාසස් (Visceral leishmaniasis) ඇතුළු ජීවිත අවදානමක් ඇති කරන දිලීර ආසාදනවලට ප්‍රතිකාර කිරීම සඳහා භාවිත කරනු ලබන ලයිපොසොමාල් වර්ගයේ ඇම්පොටෙරිසින් බී වයල් මිලිග්‍රෑම් 50න් වයල් 54,000ක් සපයා ගැනීම පිණිස ජාත්‍යන්තර තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු තුනක් (03) ලැබී තිබේ. එම ලංසු ඇගයීමෙන් අනතුරුව ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම්ව, සාරානුකූල ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන ඉන්දියාවේ Gufic Biosciences Ltd., (Manufacturer: Gufic Biosciences Ltd., India) වෙත මුළු පිරිවැය හා ගැල් කුලී මිල (ගුවන්) ඇමෙරිකානු ඩොලර් 702,000/-ක මුදලකට එකී ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **වලපනේ නව මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම**

පූර්ව කොන්ත්‍රාත්කරු විසින් අතරමග වැඩ නවතා තිබූ, වලපනේ නව මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා 2025-06-02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සඳහා ජාතික තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇති අතර, ඒ සඳහා ලංසු 06ක් ලැබී ඇත. එම ලංසු ඇගයීමෙන් අනතුරුව ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව, වලපනේ නව මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්කුව රුපියල් මිලියන 554.47ක මුදලකට (එකතු කළ අගය මත බදු සහ අවිනිශ්චිත වියදම් රහිත) නවලෝක කන්ස්ට්‍රක්ෂන් (පුද්ගලික) සමාගම වෙත පිරිනැමීම පිණිස අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **සාම්පූර්-කප්පල්තුරෙයි සම්ප්‍රේෂණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

ප්‍රශස්ත විදුලිබල පද්ධති කාර්යක්ෂමතාවක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය සම්ප්‍රේෂණ පද්ධති සවිබලගැන්වීම පිණිස, ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ මූල්‍ය පහසුකම් ලබා ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන සාම්පූර්-කප්පල්තුරෙයි සම්ප්‍රේෂණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සාම්පූර් කිලෝවෝල්ට් 220(132)/33 සූර්ය බලශක්ති ග්‍රිඩ් උපපොළ ඉදි කිරීම සහ කප්පල්තුරෙයි කිලෝවෝල්ට් 220(132)/33 සූර්ය බලශක්ති ග්‍රිඩ් උපපොළ විශාල කිරීම සඳහා 2025-12-15 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම පිණිස ජාත්‍යන්තර තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇති අතර, ඒ සඳහා ලංසු 06ක් ලැබී ඇත. එම ලංසු ඇගයීමෙන් අනතුරුව ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම්ව, සාරානුකූල ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන Joint Venture of Ceylex Engineering (Pvt.) Ltd and Xingneng Electric Power Construction Co. Ltd. වෙත ඇමෙරිකානු ඩොලර් මිලියන 4.15ක, යුරෝ මිලියන 0.78ක සහ ශ්‍රී ලංකා රුපියල් මිලියන 1,096.08ක මුදලකට (බදු රහිත) එකී කොන්ත්‍රාත්කුව පිරිනැමීම පිණිස බලශක්ති අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **මෙගාවොට් 100/මෙගාවොට් පැය 100 බැටරි බලශක්ති ගබඩා පද්ධති සංවර්ධනය කිරීම සඳහා කොලොන්නාව ග්‍රිඩ් උපපොළ වැඩිදියුණු කිරීම**

දිගුකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලසුම්වලට අනුකූලව, ශ්‍රී ලංකාවේ ප්‍රථම උපයෝගිතා පරිමාණයේ බැටරි බලශක්ති ගබඩා පද්ධතිය (BESS) කොලොන්නාව ග්‍රිඩ් උපපොළෙහි ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුව විසින් යපයනු ලබන අරමුදල් යොදා ගනිමින් විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීමේ සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය යටතේ මෙගාවොට් 100/මෙගාවොට් පැය 100 බැටරි බලශක්ති ගබඩා පද්ධති සංවර්ධනය කිරීම සඳහා කොලොන්නාව ග්‍රිඩ් උපපොළ වැඩිදියුණු කිරීම පිණිස 2024-09-02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාක්කරුවෙකු තෝරා ගැනීමට ජාත්‍යන්තර තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇති අතර, ඒ සඳහා ලංසු 04ක් ලැබී ඇත. එම ලංසු ඇගයීමෙන් අනතුරුව ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය මත පදනම්ව, සාරානුකූල ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන, Joint Venture of Ceylex Engineering (Pvt.) Ltd and Xingneng Electric Power Construction Co. Ltd. වෙත ඇමෙරිකානු ඩොලර් මිලියන 1.27ක,

යුරෝ මිලියන 2.61ක සහ ශ්‍රී ලංකා රුපියල් මිලියන 555.13ක මුදලකට (බදු රහිත) එකී කොන්ත්‍රාත්තුව පිරිනැමීම පිණිස බලශක්ති අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **පොකුරු බෝම්බ සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් බලාත්මක කිරීම සඳහා නීතිමය විධිවිධාන සැලැස්වීම**

ශ්‍රී ලංකාව විසින් 2018-02-28 දින පොකුරු බෝම්බ සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතියට (ඔස්ලෝ සම්මුතිය) අත්සන් තබා තිබේ. එම සම්මුතිය යටතේ වන බැඳීම් මෙරට බලාත්මක කිරීම සඳහා අවශ්‍ය පනත් කෙටුම්පත් කිරීම පිණිස 2019-03-19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පොකුරු බෝම්බ තහනම් කිරීමේ මූලික පනත් කෙටුම්පතට අවස්ථා ගණනාවකදී යෝජනා කරනු ලැබ ඇති සංශෝධන ඇතුළත් කරමින් එම පනත් කෙටුම්පත යාවත්කාලීන කරනු ලැබ තිබේ. එකී පනත් කෙටුම්පතට ඇතුළත් කිරීම සඳහා මේ වන විට හඳුනා ගනු ලැබ ඇති නව සංශෝධන ද ඇතුළත් කරමින් පොකුරු බෝම්බ තහනම් කිරීමේ පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා වර්තමාන රජයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

****